# දෙමළ ත්‍රස්තවාදයේ උපත සහ විපත

**ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ හිටපු වේත්‍රධාරි මේජර් වී. බී. කරුණාරත්න විසිනි**

බහු වාර්ගික ජන සමාජයක් තුළ සුළු ජාතීහු තම ඉල්ලීම් දිනාගැන්මට ක්‍රම වේද තුනක් භාවිතා කරති. **1.** ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය **(Democratic means) 2.** සාකච්ඡා ගිවිසුම් සහ බේරුම්කාර මණ්ඩල **(Dialogue and Pacts and Negotiation) 3.** බලහත්කාරකම නොහොත් ත්‍රස්තවාදය **(by force or terrorism)** වේ.

ශ්‍රීලංකාවේ **16%** ක් වූ දෙමළ ජනතාව තම අභිලාෂයන් ඉටුකර ගැන්මට උත්සාහ කළේ **1931** මහ මැතිවරණයේ සිටය. ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ සර්වජන ඡන්දය හා පාර්ලිමේන්තු ක්‍රමය අත්විඳීමට ලද ප්‍රථම අවස්ථාවේම උතුරේ දෙමළ ජනතාව එම මැතිවරණය වර්ජණය කළෝය. එසේම කිසිවෙකුටත් උතුරේ ආසන සඳහා ඉදිරිපත් වන්නට ඉඩ නුදුන්හ.

එය බලහත්කාරකමේ ලක්ෂණයක් වේ. බලහත්කාරකමේ අන්තය ත්‍රස්තවාදය බව එදා උතරේ කිසිදු ද්‍රවිඩයෙකුට වැටහුණේ නැත. විෂ්මය ජනක කාරණය නම් ඊට පෙර **1912** දී ශ්‍රීලාංකික උගත් පිරිස නියෝජනය කිරීම පිණිස මන්ත්‍රීවරයෙකු තෝරාපත් කරගැන්ම සඳහා පැවති මැතිවරණයේදී සිංහළ බහුතරය සිංහළ අපේක්ෂකයෙකු වන මාකස් ප්‍රනාන්දු පරදවා උතුරේ පොන්නම්බලම් රාමනාදන් වැඩි ඡන්දයෙන් පත්කර ගත්හ.

**1947** වන විට පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ආසන වලින් හරි අඩක්ම එනම් **50%** ක්ම සුළු ජාතීන්ට වෙන් කළ යුතුයයි උතුරේ දෙමළ දේශපාලනඥයෝ හඬ නැගූහ. මේ කිසිවිටෙකත් ශ්‍රීලංකා රජය හෝ දකුණේ සිංහළ දේශපාලනඥයෝ දෙමළ ජාතිය සාධකයක් කොට කිසිදු අසාධාරණයක් නොකළහ.

1957 බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුම, 1965 ඩඩ්ලි චෙල්වනායගම් ගිවිසුම, 1987 ජේආර් - රජීව් ගාන්ධි ඉන්දු ලංකා ගිවිසුම, 1998 චන්ද්‍රිකා කුමාරතුංගගේ නව ව්‍යවස්ථා යෝජනා වලිය, 1992 දී ආර් ප්‍රේමදාස විසින් උතුරේ පළාත් සභා පිහිටුවීම, 2002 රනිල් වික්‍රමසිංහගේ සාම ගිවිසුම, 2006 මහින්ද රාජපක්ෂගේ මග පෙන්වීම යටතේ ඔස්ලෝ සාකච්ඡා ආදිය මගින් සිංහළ නායකයන් උත්සාහ කළේ රට නොබෙදා බලය බෙදීමේ වැඩ පිළිවෙල කට යාමටය. මෙම යෝජනාවල අන්තර් ගත න්‍යායාත්මක හා ප්‍රායෝගික ක්‍රියාවලිය පිළිබඳ කිසිවක් නොදන්නා පිරිස් විවිධ සටන් පාඨ සමාජයට ඉදිරිපත් කළා මිසක ඵලදායී විවේචන හෝ සංශෝධන ඉදිරිපත් කළේ නැත.


1970 වන විට උතුරේ දෙමළ තරුණයන් මෙන්ම, දකුණේ සිංහළ තරුණයෝද විප්ලවවාදී අදහස් වලින් පිරී සිටි අතර ඒ අනුව මන්මත්ව ක්‍රිය කළහ. වාසනාවකට දකුණේ තරුණ පෙළ ඉක්මනින් කරුණු තේරුම් ගත්තා පමණක් නොව ප්‍රජාතන්ත්‍රවාදී මග තෝරාගත්හ. ඔව්හු අද ශ්‍රීලංකාවේ තුන්වන දේශපාලන බලවේගය බවට පත්ව සිටිති.

එහෙත් උතුරේ දෙමළ දේශපාලකයෝ ඡන්දය දිනාගැන්ම සඳහා තරුණයන් කළඹවන කතා සහ සටන් පාඨ හඬ නැගූහ. ඡන්දය දිනා කොළඹ පැමිණි පසු ඔවුන් අනුගමනය කළේ ව්‍යාජ එමෙන්ම දෙබිඩි පිළිවෙතකි.

ඒවන විට ශ්‍රීලංකාවේ සිංහළ, දෙමළ, මුස්ලිම් යනුවෙන් බෙදීමක් නොවීය. **1954** ශ්‍රීලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය ලේකම් ද්‍රවිඩයෙකි. (පී. නඩේසන්) ශ්‍රීලංකාවේ ප්‍රථම ලාංකික යුද හමුදාපතිවරයා ද්‍රවිඩයෙකි. (ඇන්ටන් මුතුකුමාරු) ආරක්ෂක ලේකම් ද්‍රවිඩයෙකි. **1936** පාර්ලිමේන්තුවේ කතානායක ධූරයට සිංහළයෝ වැඩි ඡන්දයෙන් සිංහළ අපේක්ෂකයෙකු පරදවා ද්‍රවිඩයෙකු පත්කරගත්හ. **1980** වනවිට ලංකා තානාපති සේවයේ **62%** ද්‍රවිඩයෝ වූහ. ගමේ නගරයේ රජයේ සේවයට ද්‍රවිඩයෝ බොහෝ දෙනා සිටියෝය. වෛද්‍ය, ගණකාධිකාරී, ඉන්ජිනේරු, පොලිස්, මිනුම්දෝරු ක්ෂෙත්‍රවල ද, සිංහළ බහුතරය වෙසෙන කොළඹ, මාතලේ, නුවරඑළිය, බදුල්ල වැනි නගර වල නගරාධිපතිවරුද ද්‍රවිඩයෝ වූහ.

එසේ නම් වැරදුණේ කොතැනද?

**1974** ජනවාරි **14** වන දින තෛපොන්ගල් දිනයට සමගාමීව ද්‍රවිඩ තරුණ සමුළුවක් යාපනයේ දී පැවැත්විණ. මෙහි ප්‍රචාරක පත්‍රිකාවල සඳහන් ප්‍රකාශන එවක යාපන නගරාධිපති ඇල්ප්‍රඩ් දෙරෙයිඅප්පාගේ සිත් නොගත්තේය. ඒවන විට ඔහු ශ්‍රීලංනිපයට බැඳී කොළඹ රජය සමග ඉතා සහයෝගයෙන් වැඩකරමින් සිටියේය. එම තත්වයට උතුරේ අනෙක් දේශපාලන පක්ෂ විරෝධය පළකර තිබුණි. ඉහතකී සමුළුව අවසානයේ පැවැත්වීමට නියමිත ප්‍රසංගය සඳහා ශාලාව සකස් කරද්දී විදුලි රැහැණක් කඩා වැටීමෙන් ද්‍රවිඩ තරණයන් තිදෙනෙකු මියගිය අතර කීපදෙනෙකට බරපතළ තුවාල සිදුවිය. මෙම සිද්ධිය නගරාධිපතිවරයාගේ අනුදැනුම මත කළ කඩාකප්පල්කාරී ක්‍රියාවකැයි සැක පහළ විය. මියගිය තිදෙනාගේ අවමඟුල දින මෘතදේහයන් යාපනයේ වීදිවල පෙරහරින් රැගෙන ගොස් මෙයට පළිගන්නා බවත් දෙමළ ජනතාවට වෙනම පාලනයක් ඉල්ලා සිටින බවත් දෙමළ තරුණ පිරිස් හඬ නැගූහ.



In 1984 a tiger cadre clad in sarong waiting for his victim.

**මුල් යුගයේ කොටි සාමාජිකයෙක්**

**1975** ජූලි **27** වෙනි දින දෙමළ තරුණයන්ගේ වෛරයට ලක්වූ යාපනයේ නගරාධිපතිවරයා මරාදැමීමෙන් දෙමළ ත්‍රස්තවාදයේ උපත සිදුවිය. ඝාතකයා වූයේද වේළුපිල්ලේ ප්‍රභාකරන්ය. එදා මෙදා තුර ජීවිත ලක්ෂයක් පමණ විනාශවිය. ආබාධිත වූවන්, අසරණ වූවන්, අවතැන් වූවන් ලක්ෂ **10** ක් පමණය. ත්‍රස්තවාදයට නැඹුරුවූ උතුරේ ද්‍රවිඩ තරුණයෝ විවිධ කල්ලි තනාගත්හ. මුලින්ම **TNA** හෙවත් දෙමළ නව කොටි නමින් බිහිවූ ප්‍රභාකරන්ගේ කණ්ඩායම පසුව LTTE විය. EPRLF, TELO, PLOTE, EROS ආදී නම් ඒ කණ්ඩායම් රාශයකින් කීපයක් පමණි. මේ හැම නමකම ඇති **E** අකුර ඊළම යන වචනය සඳහාය.

**1976** මැයි **15** වෙනි දින සියළුම ද්‍රවිඩ දේශපාලකයෝ වඩුක්කොඩෙයි නගරයට රැස්වූහ. චතුකරයෙන් ගිය තොන්ඩමන්ද ඊට සහභාගිවිය. රැස්වීම අවසන සියළු දෙන පොදු ප්‍රකාශනයකට අත්සන් තැබූහ. එයින් කියැවුණේ දෙමළ නිජබිම් සංකල්පයක් ඇතිකොට අවසානයේ ද්‍රවිඩයන් සඳහා ස්වයං පාලනයක් සහිත ඊළම් දේශයක් බිහිකරීමයි. ප්‍රභාකරන්, උමා මහේෂ්වරන්, සභාරත්නම්, සිද්ධාර්ථන්, තංගවේලු වැනි කල්ලි නායකයෝ ඊළම් සංකල්පය ක්‍රියාවටම නැංවීමේ සන්නද්ධ අරගලය ආරම්භ කළහ.

**2009** මැයි **18** දිනය වන තෙක් මෙම ද්‍රවිඩ සන්නද්ධ අරගලයේ පහරදීම් සටන් නැවැත්වීම් සාමකථා යෝජනා යුද මෙහෙයුම් පිපිරවීම් ආදී සියයක් දේවල් සිදුවුණි. ප්‍රභාකරන් සන්නද්ධ අරගලයේ නායකයා වූයේය. ඔහු අනෙක් කණ්ඩායම් වල නායකයන් ඝාතනය කළේය. ඔහු කළ ඝාතන රැසක අරමුණක් පවා නොවීය.



Tigers' first kill - The Mayor of Jaffna
**Alfred Doreyappa**

දෙමළ ත්‍රස්තවාදීන්ට අවශ්‍ය වූයේ ඊළම් දේශයක් ලංකාවෙන් තනාගැන්මය. අඩුම තරමේ පළාත්පාලන ක්‍රමයකට අනුරූප ස්වයං පාලන ක්‍රමයකටවත් ඔවුන්ගේ කැමැත්තක් නොවීය. **1975** සිට **2009** දක්වාවූ වසර **34** ක කාලයක් තුළ උතුරේ ත්‍රස්තවාදීන් ප්‍රජාතන්ත්‍රවාදී මගකට ගන්නට කළ උත්සාහ තුනක් රජයට වැරදිණ. දෙමළ ජනතාවට ස්වයං පාලනයක් හිමිකර ගැන්මට ලද අවස්ථා **4** ක් ප්‍රභාකරන් මඟහැරියේය.

**1980** දෙසැම්බර් **19** යෝජනා නමින් ප්‍රසිද්ධ දිස්ත්‍රික් සංවර්ධන සභාවක් ලබාදෙන ලදී. එකල සන්නද්ධ අරගලවල යෙදී සිටි **LTTE** සහ දකුණේ **JVP** එම දිස්ත්‍රික් සභාක්‍රමයට කැමතිවීය. එහෙත් පසුව එම ක්‍රමය දියාරු කර හැරීමට රජය ක්‍රියාශීලී විය.

රජය වරක් **1985** දි උතුරට අන්තර් පාලන ක්‍රමයක් ලබාදීමට කැමතිවිය. අන්තර් පාලනයේ ප්‍රධානියා පත්කිරීමේ මතභේදයක් මත කොටි සංවිධානය එම අවස්ථාව මඟහැරියේය. ශයිලොක් මස් රාත්තලම ඉල්ලුවාසේ ප්‍රභාකරන් ඊළම් දේශයක්ම ඉල්ලුවේය. දිගටම මිනිස් ඝාතන සිදුකරන විට ශ්‍රීලංකා රජය සහ සිංහළ ජනතාව නම්‍ය වී කිසි දිනක කොටි සංවිධානය පරාජය කළ නොහැකියයි පිළිගෙන කර කියාගත නොහැකි තත්වයකට පත්වේයයිද, එවිට ඉන් නිසැකවම ඊළමකට මග පෑදේවී යයිද ප්‍රභාකරන් සිතා සිටින්නට ඇත. ඒ සඳහා ඔහු තව තවත් ආයුධ රැස් කළේය. ගුවන් හා මුහුදු කොටි බලකාය ශක්තිමත් කළේය. ජාත්‍යන්තර ප්‍රචාරක ජාලයක්ද, රට රටවල ඩයස්පෝරාවෙන් එකතු කරන විශාල මුදල් සම්භාරයන්ද ඊටත් වඩා ප්‍රබලම ආයුධය වූ මරාගෙන මැරෙන ඒකකයක්ද තිබුණු බැවින් ඊළම ළඟ ළඟම පෙනෙන තත්වයක් ප්‍රභාකරන් ඇතුළු කොටි සංවිධානයට ඇතිවිය.

කොටි සංවිධානයේ යුදමය ශක්තියට සමාන්තරව ශ්‍රීලංකා හමුදාවේ සහ මෙහෙයුම් වලද විශාල වර්ධන සිදුවීය. **1996** රිවිරැස ක්‍රියාන්විතය මගින් යාපනය නැවත අත්පත් කරගන්නා ලදී. නවීන තාක්ෂණය හා අවිආයුධ හමුදාවට ලැබිණ. එසේම උසස් නිලධාරීහුද සටන් බිමටම ගොස් සටන් මෙහෙයවූහ. එය සාමාන්‍ය සෙබළ ගණයාගේ චිත්ත ධෛර්‍යය වඩවන්නක් වී. ඒ සියල්ල මෙන්ම රටේ ජනතාවගේ ආශීර්වාදය නිරතුරුවම හමුදාවට ලැබිණ.

සාම සාකච්ඡා ගිවිසුම් වෙනුවෙන් විවිධ රටවල් රාජ්‍යයන් පුද්ගලයින් ඉදිරිපත් වූහ. ඉන්දියාව නෝර්වේ යුරෝපා සංගමය ජපානය එක්සත් ජාතීන්ගේ සංවිධානය ද ඉන් ප්‍රධාන බලපෑම් වීය.

කොටි සංවිධානය සාමාන්‍ය සිවිල් ජනයා මෙන්ම රාජ්‍ය නායකයන්ද ඝාතනය කරමින් සිදුකරන ලද මහා විනාශය නම් ගම් වශයෙන් මෙහි සඳහන් නොකළත් බොහෝ දෙනා දනිති. ඝාතන ප්‍රයත්නයෙන් බේරුණු ප්‍රධාන පෙළේ දේශපාලනඥවරිය චන්ද්‍රිකා කුමාරතුංග පමණය. රජයේ නිළධාරීන්ගෙන් බේරුණේ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සහ යුද හමුදාපති සරත් පොන්සේකා පමණකි. ඒ දෙදෙනගේ ජීවිත බේරීම කොටි සංවිධානය නයාට ගසා පොල්ල වරද්දා ගැනීමක් ලෙස සැලකිය හැකිය. මක්නිසාද එල්ටීටීඊය නැත්තටම නැති කළ යුතුයයි දෘඪතර අධිෂ්ඨානයක් රජයට ඇතිවුණේ එයින් පසුව බැවිනි. එතැන්සිට ක්‍රියාතමක වූයේ ඒ වැඩ පිළිවෙලයි.

හමුදාපතිවරුන්, ආරක්ෂක ලේකම් එකතුව කළ සැළසුම් නූලට ක්‍රියාත්මක වූ අතර, ඊට දේශපාලන නායකත්වයද කදිමට එක්විය. රටේ ජනතාව පෙර නොවූ විරූ ලෙස එකාවන්ව රණවිරුවන්ට ධෛර්‍යය සැපයූහ. සුබාසිංශනය කළහ. දිවා රෑ සිය සිත්හි ඔවුන් රඳවා තබා ගෞරව කළහ. එහි අවසානය වූයේ කිසිදා පරාජය කළ නොහැකියයි මුළු ලෝකයාම කී කොටි සංවිධානයත්, ප්‍රභාකරන් නම් ප්‍රධාන කොටියා ඇතුළු කොටි නායකයනුත් එකෙකු නැර සියල්ලන්ම විනාශවීමෙනි.

මේ විජයග්‍රහණය සාමූහික ක්‍රියාදාමයක අගනා ප්‍රතිඵලයක් බව සැබෑය. එහෙත් බොහෝ දෙනා ඒකමතිකව ජයග්‍රහණයේ වැඩි ප්‍රමාණයේ හිමිකරුවන් ලෙස සිය ජීවිතය උපන් දේශය වෙනුවෙන් පුද දෙමින් අභීතව සටන් කළ අභිමානවත් රණ විරුවන් නම් කරති. එහි කිසිදු විවාදයක් නැත. සැබැවින්ම එය එසේ විය යුතු ය.



(below) The young Prabhakaran in the days he set-up LTTE

**The end of a dream at dawn**
**සිහිනයක අවසානය**

